www.wsws.org **ලෝක සමාජවාදී වෙබ් අඩවිය**
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ කල්ලි මුස්ලිම් වරුන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය යොදා ගනිති

## Sri Lanka: Sinhala-Buddhist mobs unleash violence against Muslims

**අපේ වාර්තාකරුවන් විසිනි**
**2014 ජුනි 17**

අන්තවාදී බොදු බල සේනා හෙවත් බෞද්ධ බලකාය විසින් මෙහෙයවූ මැර කල්ලි, 15දා අලුත්ගම නගරයේ මුස්ලිම් කඩ සාප්පු හා නිවාස ගිනිතැබූ අතර දෙදෙනෙකු මරා තවත් දුසිම් ගනනකට තුවාල සිදුකලහ.

හොඳින් සැලසුම්කර සිදුකල ප්‍රහාර මගින් මෙරට වාර්ගික ආතතීන් උත්සන්න කෙරී ඇති අතර ජනාධිපති මහින්ද රාජපක්ෂ ආන්ඩුවේ ප්‍රතිපත්ති කෙරේ වැඩකරන ජනතාව අතරින් නැගෙන විරුද්ධත්වය නොමග යැවීම සඳහා ෆැසිස්ට් වර්ගයේ කන්ඩායම් දිරිගන්වන්නේ කෙසේ ද යන්න මෙයින් පෙන්නුම් කරයි.

බොබසේ ප්‍රහාරය උසිගැන්වූයේ පොලිසිය හා එහි කොමාන්ඩෝ භටයින් බලා සිටියදීය. පසුව ආන්ඩුව සන්නද්ධ රථ හා හමුදාව ප්‍රදේශය වෙත කැඳවන ලදී. 15දා හා 16දා රාත්‍රියේ පොලිසිය බහුතරයක් මුස්ලිම්වරු වෙසෙන අලුත්ගම හා බේරුවල නගර වලට ඇඳිරි නීතිය පැනවීය. මෙම මැදිහත්වීම් වලින් පසුව බොබසේ උසිගැන්වූ මැර කල්ලි වලට නිදැල්ලේ යාමට පොලිසිය ඉඩ සැලසීය. සිදුවූයේ ආතතිය තවත් උත්සන්න වීම පමනි.

ප්‍රදේශයේදී "බෞද්ධ භික්ෂුවකට පහරදීම පිලිබඳව විරෝධය පල කරන" බව කියමින් අලුත්ගම නගරයේ රැස්වීමක් සංවිධානය කල අවස්ථාවේ 15දා සවස බොබසේ ප්‍රචන්ඩ ක්‍රියා උසිගැන්වීය. දින තුනකට පෙර බෞද්ධ භික්ෂුවකට හා ඔහුගේ රියැදුරාට මුස්ලිම් තරුනයෙකු විසින් සිදුකල බවට වාර්තා කෙරුනු පහරදීමක් ගැන ඔවුහු සඳහන් කලහ. පොලිසිය මුස්ලිම් තරුනයින් දෙදෙනෙක් අත්අඩංගුවට ගෙන සති දෙකකට රඳවා තබන ලදී. කෙසේ වුව ද බොබසේ වාර්ගික ගැටුම් ඇවිලවීම සඳහා සිද්ධිය නිමිත්තක් කර ගත්තේය.

රැස්වීමේදී කථා කරමින් බොබසේ නායක ගලගොඩ අත්තේ ඥානසාර භික්ෂුව, ප්‍රසිද්ධියේම මුස්ලිම් වරුන්ට තර්ජනය කලේය. "මේ රටේ ඇත්තේ සිංහල පොලිසියකි, අපට ඇත්තේ සිංහල හමුදාවකි. අදින් පසුව එක මරක්කයෙක් වත් නැත්නම් වෙනත් පරයෙක් වත් සිංහලයෙකුට අත තිබ්බොත් ඒ ඔවුන්ගේ අවසානයයි." ඔහු එසේ පැවසීය.

තවත් අන්තවාදී පක්ෂයක් වන ජාතික හෙල උරුමයේ නායකයෙක් හා ගායකයෙකු වන මදුමාධව අරවින්ද සිංහලයින්ට නැගී සිටින ලෙස කියන ගීතයක් ගායනා කලේය.

රැස්වීම අවසානයේ 1000කට වැඩි කන්ඩායමක් මුස්ලිම් විරෝධී සටන් පාඨ කියමින්, පහරකෑමට ලක්වූ භික්ෂුව වාසය කරන පන්සල දෙසට, මුස්ලිම් බහුතරයක් වෙසෙන දර්ගා නගරය හරහා ගමන් ගැනීමට පටන් ගත්හ. පොලිසිය පෙලපාලියට අවසර දුන් අතර මුස්ලිම්වරු ප්‍රතිප්‍රහාර එල්ල කරනු ඇති බව කියමින් වාහනවල ගමන් ගන්නා ලෙස ඉල්ලුවේය. වාහන පෙලපාලියට මුස්ලිම්වරු ගල් ගැසීමට පටන් ගැනීමෙන් පසුව ගැටුම් ඇවිල ගිය බවට පොලිසිය චෝදනා කලේය.

අලුත්ගම ආසන්නයේ පිහිටි වැලිපිටිය ගමේ 38 වියැති මොහමඩ් ඉස්ලාම් හා 30වන වියේ පසුවූ මොහෙමඩ් සිරාස් යන දෙදෙනාගේ හිසට වැදුනු පහර වලින් ඔවුහු මිය ගියහ. අලුත්ගම සිට කිමී හයක් දුරින් පිහිටි තුන්දූව ගමට ද මැරයෝ පහර දුන්හ. මුස්ලිම්වරු දුසිම් ගනනක් තුවාල ලදහ. එහෙත් බොහෝ දෙනෙක් සිය ආරක්ෂාව ගැන බියෙන් රෝහල් වෙත නොගියහ. සිංහල හා මුස්ලිම්වරු 30ක් පමන කලුතර මූලික රෝහලට ඇතුලු කරන ලදී.

ආන්ඩුව හා පොලිසිය විනාශය සිදුවීමට ඉඩ හැරියේය. ඇසින් දුටුවන් ලොසවෙඅ වාර්තාකරුවන්ට පැවසුවේ පොලිස් කොමාන්ඩෝ භටයින් ප්‍රහාරය නිරීක්ෂනය කරමින් සිටි බවයි. ඇඳිරි නීතිය පනවා තිබියදී පවා මැරයෝ, නිදැල්ලේ හැසිරෙමින් කඩ සාප්පු කොල්ල කෑවෝය.

16දා සවස කැබිනට් ඇමති හා ජාහෙඋ නායක චම්පික රනවක, ඔහු සමග ගමන්ගත් බෞද්ධ භික්ෂූන් පිරිත් කියන අතර තුවාල ලබා සිටි මැරයින්ගේ සුවදුක් විමසීමේ යෙදුනි. එදින ද සිංහල කන්ඩායම් දර්ගා නගරය දෙසට යාමට තැත් කරනු දැකගත හැකිවූ අතර ආතතිය අනෙකුත් ප්‍රදේශ වෙත ද පැතිර ගියේය. මාධ්‍ය

වාර්තා කල පරිදි මාවනැල්ලේ හා බදුල්ලේ සමහර කඩ සාප්පු වලට පහරදී තිබුනි.

ප්‍රචන්ඩ ක්‍රියා තවදුරටත් පැතිරයාම වැලැක්වීමේ "යාන්ත්‍රනයක්" සැකසීම සඳහා කැබිනට් ඇමතිවරු ගනනාවකගේ හා මුස්ලිම් හා අනෙකුත් ආගමික නායකයින්ගේ සහභාගිත්වයෙන් විශේෂ රැස්වීමක් අගමැති දි.මු. ජයරත්නගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන බව ආන්ඩුව නිවේදනය කලේය. මෙය සම්පූර්න යට ගැසීමකි. ආන්ඩුවට බොබසේ හා අනෙකුත් අන්තවාදී සංවිධාන සමග සමීප සම්බන්ධකම් ඇත. ප්‍රචන්ඩ ක්‍රියා උසිගැන්වූ ඥානසාර භික්ෂුව ද විශේෂ රැස්වීමට සහභාගීවූ බව *කොලම්බොටෙලිග්‍රාෆ්* වෙබ් අඩවිය වාර්තා කලේය.

අලුත් ප්‍රචන්ඩ ක්‍රියා පැතිර යන රටාවක කොටසකි. අලුත්ගම පවා මීට පෙර මුස්ලිම් කඩයක් ගිනිතබා තිබුනි. වඩාත් පුලුල් වශයෙන් ගත් කල, පසුගිය දෙවසරක කාලය තුල, බොබසේ, සිහල රාවය හා රාවනා බලකාය විසින් මුස්ලිම් වරුන්ට මෙන්ම ක්‍රිස්තියානි භක්තිකයන්ට ද කලින් සූදානම් කල ප්‍රහාර මාලාවක් එල්ල කර තිබේ.

මේ වසරේ පමනක් බොබසේ, මැරකමේ උච්ඡ තලයේ ක්‍රියා ගනනාවකට සම්බන්ධවී ඇත. අප්‍රේල් 09දා වාර්ගික හා ආගමික සාමය සඳහා කැඳවුම් කල ප්‍රතිවාදී බෞද්ධ කන්ඩායමක් පැවැත්වූ මාධ්‍ය සමුලුවකට ඔවුහු කඩාවැදුනහ. පොලිස් නිලධාරීන් අනුමැතිය සහිතව බලා සිටියදී ඥානසාර භික්ෂුව, එම කන්ඩායමේ නායක භික්ෂුවට අඩන්තේට්ටම් කලේය. අප්‍රේල් 22දා බොබසේ කල්ලියක්, සතුරු භික්ෂුව සැඟව සිටින්නේ යයි පවසමින් මුස්ලිම් අමාත්‍යාංශයට කඩා වැදුනේය.

දැනට විදේශගතව සිටින රාජපක්ෂ ට්විටර් සටහනක් යොදමින් මෙසේ සඳහන් කලේය. "අලුත්ගම සිදුවීම් සඳහා වගකිවයුත්තන් නීතියේ රැහැනට හසුකර ගැනීමේ නීතිමය පරීක්ෂනයක් දියත් කෙරෙනු ඇත. නීතිය තම අතට ගැනීමට ආන්ඩුව කිසිවෙකුටත් ඉඩ දෙන්නේ නැත. පීඩාවට පත්ව සිටින සියලු පාර්ශවයන්ගෙන් මා ඉල්ලා සිටින්නේ ඉවසිලි සහගත වන ලෙසයි."

මෙය නම් අමූලික කුහක කමයි. සිංහල-බෞද්ධ වර්ගවාදියෝ කිසිදු නීතියක් නොතකමින් දන්ඩ මුක්තිය සහිතව ක්‍රියා කරති. "සියලු පාර්ශවයන්ගෙන්" ඉවසිලි සහගතව කටයුතු කරන ලෙසට ඉල්ලීමේ තේරුම ප්‍රචන්ඩතාවන්ට ලක්වූ මුස්ලිම්වරුන්ට චෝදනාව එල්ල කිරීමයි. රාජපක්ෂ හා ඔහුගේ සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, අන්තවාදී කන්ඩායම් වලට අනුග්‍රහය දක්වන අතර බෞද්ධ සංස්ථාපිතයට වාසි වන අයුරින් ඔවුන්ගේ ඉල්ලීම් ඉටුකර දෙන බවට පොරොන්දුවී ඇත.

මුස්ලිම් විරෝධී මනෝගතීන් ඇවිස්සීමට බෞද්ධ අන්තවාදීන් උපයෝගී කරගන්නා අතර රාජපක්ෂ හා ඔහුගේ ආන්ඩුව, පරාජයට පත්කල එල්ටීටීඊය යලි හිස ඔසවන බව පවසමින් දෙමල විරෝධී වර්ගවාදයේ ද පිහිට පතයි.

තමන් ක්‍රියාවට නගන කප්පාදු පියවරයන් සම්බන්ධයෙන් වැඩකරන ජනතාව හා තරුනයින් අතර වර්ධනය වෙමින් ඇති ප්‍රතිරෝධය පිලිබඳව ආන්ඩුව කලබලයට පත්ව සිටියි. මෑතකදී වෘත්තීය සමිති පසු පසට අදින තතු තුල පවා විදුලි බලමන්ඩල කම්කරුවෝ වැඩි වැටුප් ඉල්ලා විරෝධතාවයේ යෙදුනහ. රාජ්‍ය සේවය පුරා සේවකයෝ විශ්‍රාම පාරිතෝෂිකය කැපීමේ ආන්ඩුවේ උත්සාහයට විරුද්ධව පිකට් කිරීම්වල යෙදුනහ. උතුරු හා නැගෙනහිර ද ඇතුලු විශ්වවිද්‍යාල සිසුන් ආන්ඩුවේ අධ්‍යාපන කප්පාදුවට එරෙහිව පෙලපාලි වලට එක්වූහ.

අලුත්ගම සිදුවූ ප්‍රචන්ඩ ක්‍රියා කම්කරු පන්තියට කෙරෙන අනතුරු ඇඟවීමකි. 1948 නිල නිදහසේ පටන් යලි යලිත් සිදුකර ඇති ආකාරයට සිංහල පාලක පැලැන්තිය, වැඩකරන ජනතාව වාර්ගික රේඛා ඔස්සේ බෙදීමට දුෂ්ඨ වර්ගවාදයේ පිහිට පතන අතර එහි ප්‍රතිපලය වන ගැටුම්, පොලිස් රාජ්‍ය පියවර උලුප්පා ගැනීම පිනිස යොදා ගනියි. මුස්ලිම් වරුන්ට එරෙහි කැත වර්ගවාදී ප්‍රහාර කම්කරුවන් විසින් හෙලා දැකිය යුතුය. සිය අරගල වාර්ගික බෙදීම් වලට ප්‍රතිවිරුද්ධව එක්සත් කරමින්, මෙරට ද ජාත්‍යන්තරව ද කම්කරු පන්තියේ පොදු අවශ්‍යතාවන් මත පදනම් කෙරෙන සමාජවාදී ක්‍රියාමාර්ගයක් සහිත කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවකට සටන් වැදිය යුතුය.

© www.wsws.org